**මධ්‍යම සංස්කෘතික අරමුදලේ ගනුදෙනු පිළිබඳ වාර්තාව - 2021, 2022 සහ 2023**

---

මධ්‍යම සංස්කෘතික අරමුදලේ 2021, 2022 සහ 2023 වර්ෂවල මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල් පනතේ 9(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13(6) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කල යුතු 2020, 2021, 2022 සහ 2023 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන 2021, 2022 සහ 2023 වර්ෂවල අරමුදලේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ පමණක් මෙම වාර්තාවේ දැක්වේ.

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍යය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මඟින් දැක්විය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට සහතික විය යුතු අතර ඒ්ට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වග බලා ගනු ලැබිය යුතුය.

### 1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් සංශෝධිත මුදල් 877 (2) (ඇ) ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2020, 2021, 2022 සහ 2023 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කළ විට තීරණ 212.02.01 අනුව 2015 සිට 2019 දක්වා කාලපර්ච්ඡේදය සඳහා පූර්ණ විගණනයක් සිදුකරවා ගන්නා ලෙසට උපදෙස් දී තිබුණි ඒ අනුව විශේෂ විගණනයක් සිදුකර වාර්තාවක් 2022.03.14 දින ලබා දෙන ලදී. මෙම කරුණු හේතුවෙන් 2020,2021,2022,2023 වර්ෂයන්හි මූල්‍යප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කිරීම ප්‍රමාද වීය. | චක්‍රලේඛ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතුය. |

## 2. විගණන නිරීක්ෂණ

### 2.1. විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2023 දෙසැම්බර් 31 දිනට කොල්ලුපිටිය ලංකා බැංකුවේ පවතින රු.405,355,795 ක් වූ ස්ථාවර තැන්පතු වටිනාකම තහවුරු කර ගැනීම සඳහා ස්ථාවර තැන්පතු සහතික හෝ බැංකු සනාථන විගණනය වෙත ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් එම ශේෂයන්ගේ නිරවද්‍යතාවය පිළිබඳ විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. | ස්ථාවර තැන්පතු සහතිකවල පිටපත් දැනටමත් විගණනය වෙත ලබාදීමට කටයුතු කර ඇත. බැංකුව විසින් එවන ලද බැංකු සනාථනයෙහි පවතින දෝෂයක් හේතුවෙන් මෙම ස්ථාවර තැන්පතු 03 ට අදාළ තොරතුරු නිසි ආකාරව දක්වා නොමැත. එය බැංකුව දැනුවත් කර නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | ශේෂ සනාථන හෝ ස්ථාවර තැන්පතු සහතික විගණනය වෙත ඉදිරිපත් කල යුතුය. |

### 2.2. නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| i. මුදල් රෙගුලාසි 110(1) | රථ වාහන අනතුරු නිසා වන අලාභ සම්බන්ධයෙන් මු.රෙ. 110(1) අනුව හානි ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | හානි ලේඛනයක් පවත්වාගෙන යාමට අදාළ අංශ වෙත උපදෙස් ලබාදී ඇති බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| ii. මුදල් රෙගුලාසි 316 | මුදල්, මුද්දර, ප්‍රවේශපත්‍ර වැනි මූල්‍යමය වටිනාකමක් සහිත අයිතම ඒ වෙනුවෙන් විශේෂිතව සම්පාදනය කොට ඇති සුරක්ෂිතාගාරයක, සේප්පුවක, ආරක්ෂිත කාමරයක හෝ වෙනත් ආරක්ෂිත ස්ථානයක සුරක්ෂිතව තැබිය යුතු වුවත්, මුද්‍රණාලය තුළ මුද්‍රිත කටයුතු අවසානයේ තාවකාලිකව ගබඩා කර තිබෙන මුද්‍රිත ප්‍රවේශපත්‍ර සහ අරමුදලේ ප්‍රධාන ගබඩාවේ තැන්පත් කර ඇති මුද්‍රිත ප්‍රවේශපත්‍ර | ප්‍රධාන කාර්යාලයේ ආරක්ෂිත ස්ථානයක් ප්‍රවේශ පත්‍ර ගබඩා කර ආරක්ෂිතව පත්වාගෙන යාම පිණිස වෙන් කර දීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | | |
| iii. | මුදල් රෙගුලාසි 835(2) (ඇ) | අරමුදල සඳහා ගිවිසුම් ගත මුදල වූ රු.28,800,000 ක් වටිනා ගොඩනැගිලි 02 ක් කුලියට ගැනීමේදී ගොඩනැගිලිවල මාසික කුලී වටිනාකම පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව ප්‍රධාන තක්සේරුකරු විමසීමට කටයුතු කර නොතිබුණි. | කුලියට ගැනීමේදී මාසික කුලී වටිනාකම පිළිබඳ ප්‍රධාන තක්සේරුකරු විමසීමට මින් ඉදිරියේදී කටයුතු කරන බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| iv. | මුදල් රෙගුලාසි 1647 (ආ) | අරමුදල සතු වාහන 162 හා ඒවායේ උපකරණ පිළිබඳව සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. | ඒ සම්බන්ධව අවශ්‍ය කටයුතු කිරීමට අධ්‍යක්ෂ (පාලන) වෙත උපදෙස් ලබාදී ඇති බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | අරමුදල සතු වාහන 162 හි ඉන්ධන දහන පරික්ෂාවක් සිදුකර නොතිබුණි. | විධිමත් පරිදි ඉන්ධන දහන පරික්ෂා කිරීම පිණිස වාහනභාර නිළධාරී වෙත උපදෙස් ලබාදී ඇති බව දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) | බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 2021 ජූලි 05 දිනැති අංක 01/2021 දරන අභ්‍යන්තර පාලන චක්‍රලේඛයේ 04 ඡේදය | එක් එක් වාහනය සම්බන්ධයෙන් සිදුකරනු ලැබූ වියදම් ඇතුළත් ගිණුමක් පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි. | එක් එක් වාහන සම්බන්ධයෙන් සිදුකරනු ලැබූ වියදම් ඇතුළත් ගිණුමක් පවත්වාගෙන යාමට ප්‍රවාහන නිළධාරී දැනුවත් කල බව දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2.3 ආයෝජන කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| 2023.11.17 දින පැවති 217 පාලක මණ්ඩල රැස්වීමේදී ස්ථාවර තැන්පතු ප්‍රති ආයෝජනය කිරීම හා අයෝජනය කිරීම සඳහා පාලක මණ්ඩලය සතු බලතල ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා (රේඛීය අමාත්‍යාංශ ලේකම්) වෙත පවරා තිබුණ ද එම තීරණයට පටහැනිව අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත ආයෝජන සිදුකර තිබුණි. | 217.04.20 දරන පාලක මණ්ඩල පත්‍රිකාව අනුව ස්ථාවර තැන්පතු ප්‍රති ආයෝජනය කිරීම සඳහා පාලක මණ්ඩලයේ සතු බලතල ප්‍රධාන ගණන්දීමේ නිළධාරි (රේඛීය අමාත්‍යාංශ ලේකම්) වෙත පවරා ඇත. | පාලක මණ්ඩල අනුමැතිය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 දෙසැම්බර් 01 දින සිට 2023 නොවැම්බර් 30 දක්වා මාසික කුලිය රු.1,200,000 ක් බැගින් ගෙවීමේ පදනම මත කොළඹ 05 ප්‍රදේශයෙන් ලබාගත් ගොඩනැගිල්ලේ මහල් 02 ක් (එකක් වර්ග අඩි 5618.31 බැගින් වූ) 2021 දෙසැම්බර් 01 දින සිට කුලී පදනම මත ලබාගෙන තිබුණද අරමුදල විසින් කුලියටගත් 02 වන මහල පරිහරණය කිරීම ආරම්භ කර තිබුණේ 2022 පෙබරවාරි 14 දිනදීය. ඒ අනුව මාස 03 කට ආසන්න කාලයක් එම මහලට අදාලව රු.600,000 බැගින් රු.1,500,000 ක් නිෂ්කාර්යව ගෙවා තිබුණි. | ඉහත කරුණට අදාලව කොළඹ 05 ප්‍රදේශයේ ලබාගත් දෙවැනි මහළ (වර්ග අඩි 5618.31 ) 2021 දෙසැම්බර් 01 වන දින සිට 2022 පෙබරවාරි 14 දින දක්වා භාවිතයට නොගැනීමට හේතු වශයෙන් එම මහල මධ්‍යම සංස්කෘතික අරමුදලේ කාර්යය කටයුතු අවශ්‍යතා සඳහා ගැලපෙන(කාර්යාල පහසුකම්) පරිදි සකස් කිරීමට යොදාගත් කාලය වේ. | ගොඩනැගිලි කුලී පදනම මත ලබා ගැනීමේදී අරමුදලට අවාසියක් නොවන පරිදි කටයුතු කළ යුතුය. |
| (ආ) අරමුදල සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකරන තෙක් අරමුදලේ ප්‍රධාන කාර්යාලය කුලී පදනම මත විවිධ පාර්ශවයන්ට අයත් ගොඩනැගිලිවල පවත්වාගෙන ගොස් තිබුණ ද නව ගොඩනැගිල්ලක් ඉදි නොකිරීම හේතුවෙන් 2017 මාර්තු මාසයේ සිට මෙම වාර්තාවේ දිනට වන විට ගොඩනැගිලි කුලි ලෙස රු.82,382,757 ක් ගෙවීම ආර්ථිකමය නොවන ගණුදෙනුවක් ලෙස විගණනයට නිරීක්ෂණය විය. | මධ්‍යම සංස්කෘතික අරමුදල ප්‍රධාන කාර්යාලය පිහිටි 212/1, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 භූමිය පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබූ බැවින් ඉදිකිරීම් කටයුතු කිරීම සඳහා කටයුතු කිරීමට නොහැකි විය. | අරමුදල සඳහා නව ගොඩනැගිල්ලක් කඩිනමින් ඉදිකිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකායර්ක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2023 වර්ෂය තුළ අරමුදලේ ව්‍යාපෘතින්හි පුරාවිද්‍යා පර්යේෂණ, කැණීම් කටයුතු, සංරක්ෂණ කටයුතු, කෞතුකාගාර හා පුරාවිද්‍යා ස්ථාන නඩත්තුව වෙනුවෙන් මූලිකව රු.727,669,273 ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණ ද වර්ෂය තුළ දී එය රු.605,039,238 ක් දක්වා අඩුකර සංශෝධනය කර තිබුණි. ඒ අනුව වර්ෂය තුළ සත්‍ය වැඩ වටිනාකම රු328,669,350 ක්වූ අතර එහි ප්‍රගතිය මූලික ඇස්තමේන්තුව සමඟ සැසඳීමේ දී සියයට 45 සහ සංශෝධිත ඇස්තමේන්තුව සමඟ සැසඳීමේ දී සියයට 54 ක මට්ටමක පැවතුණි. මේ අනුව | 2023 වර්ෂය තුළ කාර්යය මණ්ඩලය සහ කම්කරුවන්ගේ පුරප්පාඩු පිරවීමට සැලසුම්කොට තිබුණද, මූල්‍ය අරබුදය හේතුවෙන් බඳවා ගැනීම් අත්හිටුවා තිබූ බැවින් අදාළ පුරප්පාඩු පුරවා ගැනීමට නොහැකි විය. එසේම ආයතනය තුළ සිටි පැවරුම් පදනමින් සේවයේ යොදවා සිටි කම්කරු කාර්යය මණ්ඩලයේ සේවා කාලය දීර්ඝ කිරීමද අත්හිටුවන ලදි. එය මෙම වැඩබිම්වල ප්‍රගතිය සඳහා ඍජුවට බලපෑම් එල්ලවිය. එහෙයින් ඉලක්කගත | තාත්වික හා නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ඇස්තමේන්තු සකස් කිරීම, යථාර්ථවාදීව සිදුකර තිබේ ද යන්න ගැටලු සහගත විය. | ප්‍රගතිය කරා ළඟාවීමට නොහැකි වූ බව දන්වා තිබුණි.. | |
| (ආ) 2022 සහ 2023 වර්ෂවලදී පිළිවෙළින් රු.222,952,508 කින් සහ රු.122,630,035 කින් අඩුකර මූලික ඇස්තමේන්තුව සංශෝධනය කර තිබූ අතර කිසියම් වැඩබිමක වාර්ෂිකව සිදුකළ යුතු කැණීම්, සංරක්ෂණ, නඩත්තු සහ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු තීරණය කිරීම, ඊට අදාළ ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම සහ ඒවායේ භෞතික ප්‍රගතිය සමාලෝචනය සුදුසුකම්ලත් ඉංජිනේරුවරයකුගේ හෝ එවැනි මණ්ඩලයක අනුමැතියකින් සහ අධීක්ෂණයකින් සිදුකර තිබූ බවට සනාථ කරගැනීමට වූ සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2022 හා 2023 වර්ෂවල සංශෝධිත ඇස්තමේන්තු අධ්‍යක්ෂ සංවර්ධන විසින් නිර්දේශ කර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කර පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන තිබේ. මේ සඳහා අදාළ ඇමුණුම විගණනය වෙත යොමුකර තිබේ. | ඇස්තමේන්තු සකස් කිරීම සහ ඒවායේ භෞතික ප්‍රගතිය සමාලෝචනය සඳහා සුදුසුකම්ලත් තැනැත්තෙකුගේ සේවය ලබාගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) අරමුදල් පනතේ 3(2) වගන්තිය ප්‍රකාරව අරමුදල පිළිබඳව පාලක මණ්ඩලයේ සභාපතිවරයා ලෙස අග්‍රාමාත්‍යවරයාගෙන් සහ ඒ ඒ විෂය භාර අමාත්‍යවරුන් රැසකින් සමන්විත පාලක මණ්ඩලයක් වීම හේතුවෙන් ආයෝජන කටයුතු සඳහා එම පාලක මණ්ඩලය රැස් කරවීම ප්‍රායෝගික නොවීමත් අරමුදල් පනත වර්ෂ 44ක් පැරණි වීම හා වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධනය කර නොතිබීම ද ගැටලු සහගත විය. | වර්තමානයේ අරමුදලේ පවතින පනත සංශෝධනය කිරීමට කමිටුවක් පත්කර සංශෝධනය කෙටුම්පත් කර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. ඉන් අනතුරුව අමාත්‍යාංශය විසින් සංශෝධිත කෙටුම්පත කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර ඇති අතර, කැබිනට් මණ්ඩලය මඟින් නව පනතක් සකස් කිරීමට තීරණය වී ඇත. වර්තමානය වන විට නව පාලක මණ්ඩලයක් පත් වීමට නියමිත බැවින් එම පාලක මණ්ඩලයේ අනුමැතිය අනුව ඉදිරි කටයුතු කරන බව දන්වා තිබුණි. | පනත සංශෝධනය කාලානුරූපීව කළ යුතුය. |
| (ඈ) අරමුදල් පනතේ 3(1) වගන්තිය ප්‍රකාරව අරමුදලේ පරිපාලනය කළමනාකරණය සහ පාලනය පාලක මණ්ඩලයකට පැවරී තිබුණ ද එම පාලක මණ්ඩලය පසුගිය වර්ෂ 03 තුළ පවත්වා තිබූ රැස්වීම් ගණන 06 ක් විය. ඒ අනුව වසරකට රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබීම අරමුදලෙහි අරමුණු ඵලදායී හා කාර්යක්ෂම ලෙස ඉටුකර ගැනීමට බාධාවක් වී තිබුණි. | පාලක මණ්ඩල රැස්වීම් සඳහා අරමුදල විසින් පසුගිය වර්ෂ 03 තුළ ඉල්ලීම් කර ඇති අතර, විවිධ හේතූන් පදනම්කරගෙන අදාළ දිනයන්හී පාලක මණ්ඩල රැස්වීම් රැස්කරවා ගැනීමට නොහැකි වූ බව දන්වා තිබුණි. | අරමුදලේ අරමුණු ඉටුවන පරිදි පාලක මණ්ඩල රැස්වීම් පැවැත්වීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) 2011 පෙබරවාරි 02 දිනැති අංක අමප/11/0/169/555/004 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අරමුදල උපයා ඇති ආදායමෙන් සියයට 25 ක් පුරාවිද්‍යා ස්ථාන පවත්වාගෙන යාම වෙනුවෙන් ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයට ලබා දිය යුතු වුවද 2019, 2020, 2021, 2022, 2023 සහ 2024 වර්ෂ වෙනුවෙන් ලබා දිය යුතු | අරමුදල දැඩි වියදම් පාලනයක් සිදුකරමින් පවත්වාගෙන යන ලදි. මේ හේතුවෙන් එම වර්ෂවල පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් කරන ලද ඉල්ලීම් වලට අනුව 25% ක දායකත්ව මුදල ලබාදිය නොහැකි වී ඇත. ඉදිරියේදී මුදල් ලබාදීම සම්බන්ධව සැලසුම් කරගෙන යනු ලබන බව දන්වා තිබුණි.. | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| පිළිවෙලින් රු.173,782,870ක්, රු.66,961,268ක්, රු.47,298,263 ක් ,රු.381,601,938ක්, රු.989,828,887ක් සහ රු.997,403,144 ක් වශයෙන් එකතුව රු.2,656,876,370 ක් එම අමාත්‍යාංශයට ලබා දී නොතිබුණි. | | |
| (ඊ) ශ්‍රී දළදා මාලිගාව ආසන්නයේ පිහිටි අරමුදලට අයත් ජාත්‍යන්තර තොරතුරු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ජනාධිපති ජොෂ්ඨ අතිරේක ලේකම්ගේ අංක PS/DSP/RAU/01/10/KP හා 2017 ජූලි 14 දිනැති ඉල්ලීම පරිදි 2017 ජූලි 23 සිට 2017 අගෝස්තු 16 දක්වා කාලය සඳහා මහනුවර ශ්‍රී පත්තිනි දේවාලයේ අවශ්‍යතා සඳහා භාර දී තිබුණද එම ගොඩනැගිල්ල ආපසු අරමුදලට භාර ගැනීමට මේ දක්වා පියවරගෙන නොතිබීම හේතුවෙන් මෙම ගොඩනැගිල්ලේ පිහිටි තොරතුරු මධ්‍යස්ථානය වෙතින් ලබාදුන් දේශීය හා විදේශීය සංචාරකයන් වෙත නොමිලේ තොරතුරු ලබා දීම, නොමිලේ ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩසටහන් පැවැත්වීම, සංස්කෘතිය හා බැඳුනු පොත් හා අනුරූ අලෙවි කිරීම, ශ්‍රී ලාංකීය සංස්කෘතිය සහ උරුමය හා බැඳුණු අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම යන සේවා වසර 4½ ක පමණ කාලයක් තිස්සේ ලබා දීමට නොහැකි වී තිබුණි. තවද අදාල ගොඩනැගිල්ලේ පවතින මිලියන 05 කට අධික බව දැක්වෙන අරමුදලේ වත්කම්ද නිශ්කාර්යව හා ඌණ උපයෝජිතව පැවතුණි. | 2018 වර්ෂයේ සිට අවස්ථා ගණනාවකදීම මහනුවර ව්‍යාපෘති කළමණාකරු විසින්මෙම ගොඩනැගිල්ල නැවත භාර ගැනීම සම්බන්ධව බස්නායක නිලමේතුමාව දැනුවත් කර ඇති අතර, අධ්‍යක්ෂ ජනරාල් විසින් ද බස්නායක නිලමේතුමන් දැනුවත් කර ලිපි යවා ඇත. මහනුවර ව්‍යාපෘතිය මඟින් මහනුවර පොලිස් ස්ථානය වෙත පැමිණිලි කිරීමටද කටයුතු කර තිබේ. පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් බස්නායක නිලමේතුමා වෙත ද 2024.12.29 දිනැතිව අධ්‍යක්ෂ ජනරාල් විසින් මේ සම්බන්ධව ලේකම්තුමා වෙතද ලිපියක් යොමුකර ඇති බව දන්වා තිබුණි. | අරමුදල සතු දේපළ නිසි පරිදි පවරා ගැනීමට කටයුතු කල යුතුය. |
| (උ) ගාල්ල ගොඩවාය ගිලුණු දැවමය යාත්‍රාවේ පුරාවිද්‍යාත්මක වාර්තාකරණය සහ පුරාවස්තු සංරක්ෂණ යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා ඇමරිකානු ඩොලර් 109,992 ක පිරිවැයක් ඇස්තමේන්තු කර තිබුණු අතර, එයින් ඇමරිකන් ඩොලර් 82,192 ක් ඇමරිකානු තානාපති කාර්යාලය මඟින් ලබාදීමට ද, ඉතිරි මුදල වූ ඇමරිකන් ඩොලර් 27,800 ක් මධ්‍යම සංස්කෘතික මුදලින් දායක වීමටත් එකඟ වී තිබුණි. ඒ අනුව 2023 දෙසැම්බර් 31 දින වනවිට ඇමරිකානු ඩොලර් 28,754 ක් ව්‍යාපෘතියට ලැබී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) 1994 අප්‍රේල් මස 20 දිනැති රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 30/94 හි 5.4 ඡේදය අනුව විදේශාධාර මුදල් | ගාල්ල ගොඩවාය ගිලුණු යාත්‍රාවේ පුරාවිද්‍යාත්මක වාර්තාකරණය සහ පුරාවස්තු සංරක්ෂණ යෝජනාව | භාණ්ඩාගාරය විසින් දෙනු ලබන උපදෙස් |

| | | |
|---|---|---|
| භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුමට බැරකළ යුතු වේ එසේ වුවද 2023 නොවැම්බර් 30 දිනැති අංක -TO/GR/01/1/1/10/971 දරන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව, ඉහත ප්‍රදානය ශ්‍රී ලංකාව වෙත ලබා ගැනීමේදී සිදුවන්නා වූ තාක්ෂණික දෝෂය පිළිබඳව සලකා බලා මෙම ප්‍රදානය ලබා ගැනීම සම්බන්ධයෙන් පමණක් වන පරිදි, එම මුදල සෘජුවම මධ්‍යම සංස්කෘතික අරමුදලේ නිල බැංකු ගිණුම වන ලංකා බැංකුවේ ගිණුමට ගෙන්වා ගැනීමට අනුමැතිය ලැබී තිබුණද අරමුදලේ නිල බැංකු ගිණුම නොවූ මහජන බැංකුවේ අංක 204302170015194 දරන ගිණුමට මෙම මුදල් ලබාගැනීමට අරමුදල විසින් කටයුතු කර තිබුණි. | ක්‍රියාත්මක කිරීම සඳහා වන විදේශ අරමුදල් තාක්ෂණික දෝශයක් මත මහා භාණ්ඩාගාරයේ ගිණුම වෙත හුවමාරු කිරීමට නොහැකි වූ බැවින් මහා භාණ්ඩාගාරයේ වාචික අනුමැතිය මත මධ්‍යම සංස්කෘතික අරමුදලේ මහජන බැංකු ඩොලර් ගිණුම වෙත සෘජුව මුදල් බැරකර ගැනීමට කටයුතු කර ඇති අතර, මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් නැවත එම මුදල් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුම් වෙත බැර කිරීමට අවශ්‍ය කටයුතු කර තිබෙන බව කාරුණිකව දන්වා සිටිමි. | පිළිපැදීමට වගබලා ගත යුතුය. |
| (ii) 2019 දෙසැම්බර් 19 දිනැති අංක ps/sp/sb/circular/06/01 දරන ජනාධිපති කාර්යාල චක්‍රලේඛයේ 2 ඡේදය ප්‍රකාරව විදේශාධාර ලබාගැනීමේ දී අමාත්‍ය මණ්ඩලයෙහි අනුමැතිය ලබාගැනීමකින් තොරව තවදුරටත් කිසිදු බැදීමක් ඇතිකර ගැනීමෙන් හෝ අවබෝධතා ගිවිසුම්වලට එළඹීම නොකලයුතු වුවද, මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් අවබෝධතා ගිවිසුම් සකස් කිරීමට කටයුතු කරමින් තිබුණ ද අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | පාලක මණ්ඩල පත්‍රිකා අංක 217.03.02 මගින් අදාළ අනුමැතිය ලැබී ඇති බව දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) ඇමරිකානු තානාපති අරමුදලේ ප්‍රදාන ලිපිය පරිදි කාර්යසාධන කාලපරිච්ඡේදය 2022 සැප්තැම්බර් 30 දින සිට 2024 නොවැම්බර් 30 ලෙස දක්වා තිබුණු අතර එම කාලය අවසන් වී තිබුණ ද, ව්‍යාපෘතියේ වැඩ අවසන් වී නොතිබුණි. 2024 ජූලි 30 දින වනවිට ලබාගත් ආධාර මුදල් වටිනාකමින් රු.7,483,594 ක් අදාළ අරමුණු සඳහා වැය කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය ගැඹුරු මුහුද තුළ අරමුදලේ සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිළධාරීන් කිහිපදෙනෙකු යොදවාගෙන සිදුකරනු ලැබේ. ගැඹුරු මුහුද තුළ සිදුකරන ව්‍යාපෘතියක් බැවින් මුහුදේ පවතින තත්ත්වය අනුව ඒ තුළ කටයුතු කිරීමේ කාලය සැලසුමට අනුව සිදු කිරීම දුෂ්කර වේ (මුහුදේ රළුවීම හා අපැහැදිලිවීම). තවද, ඒ සඳහා අවශ්‍ය විශාල වටිනාකම් වලින් යුත් විවිධ ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගැනීම ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුගත වෙමින් කරගෙන යාමේදී පිරිවිතරවලට ගැලපෙන භාණ්ඩ සඳහා ලංසු නොලැබීම නිසා නැවත මිළ කැඳවීමට සිදුවිය. එසේ දෙවන වරටත් මිළ කැඳවීම් සිදුකර මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන තීරණ ලබාගත්තද මෙම විශේෂිත වූ භාණ්ඩ හා ද්‍රව්‍ය සැපයුම්කරුවන් විසින් ආනයනය කර | ප්‍රදාන කාර්යක්ෂම හා ඵලදායී ලෙස භාවිතා කිරීමට හැකිවන අයුරින් කාර්යයන් සැලසුම් කල යුතුය. |

| | | |
|---|---|---|
| | ලබාදියයුතු වූ බැවින් භාණ්ඩ සැපයීම සඳහා කාල ප්‍රමාදයක්ද සිදු වූ බව දන්වා තිබුණි. | |
| (ඌ) සීගිරිය විදේශීය රථගාල අසල මොරගහමුළ ප්‍රදේශයේ වෙළඳ කඩ සහ කුඩවලින් සකස් කළ වෙළඳසැල් ඇතුලුව කඩකාමර 37 ක් බදුදීම සඳහා 2014 වර්ෂයේ දී ගිවිසුම්ගතව තිබුණු අතර 2015 වර්ෂයේ සිට 2024 ජූනි මස 30 දින දක්වා තවදුරටත් අරමුදලට අයවිය යුතු හිඟ බදු කුලිය රු.2,584,000 ක් බව නිරීක්ෂණය විය. | ඉතිරි හිඟ වාරික මුදල් ද කඩකුඩ හිමියන්ගෙන් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව දන්වා තිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කාල ප්‍රමාදයකින් තොරව බදු කුලිය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (එ) දුර්වල පාෂාණයකින් නිමවා තිබුණු අව්වැසි වලට නිරාවරණය වීම නිසා භෞතික හා රසායනික ජීරණයට ලක්ව බෙහෙවින් දුර්වල තත්ත්වයක පත්ව තිබූ බුදුරුවයාය සැතපෙන පිළිම වහන්සේ සඳහා පියස්සක් ඉදි කිරීමට ප්‍රමුඛ අවධානය යොමු කරන ලෙස දන්වා සංස්කෘතික අමාත්‍යාංශය විසින් මධ්‍යම සංස්කෘතික අරමුදල වෙත ලබා දුන් උපදෙස් අනුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් ලබාගත් අනුමැතියෙන් පසුව 2019 නොවැම්බර් 04 දින බුදුරුවයාය සැතපෙන පිළිම වහන්සේ සඳහා පියස්සක් ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් පසු ලිඛිත ගිවිසුමකින් තොරව රු.1,941,433 ක වටිනාකමට දින 150 ක් තුල සම්පූර්ණ කිරීමට ඉදිකිරීම් ආයතනයට පිරිනමා තිබුණද විගණිත දිනය වූ 2024 ඔක්තෝබර් 06 වන විටත් රු.874,019ක වටිනාකමක බිල්පත් ඉදිරිපත් වී තිබුණද කොන්ත්‍රාත්තුව සඳහා ගිවිසුමක් ඉදිරිපත් නොවීම හේතුවෙන් ගෙවීම් කටයුතු කිරීමට නොහැකි වීම මත ඉදිකිරීම් කටයුතු අසම්පූර්ණව නතර වී වසර 4 ½ ක් ගතව ඇතත් අදාල ඉදිකිරීම සිදුකර නොතිබුණි. | වැඩ සැලැස්මට අනුව පාලක මණ්ඩල අනුමැතිය ඇත.කොන්ත්‍රාත්කරු විසින් මෙම කාර්යය ආරම්භ කර තිබුණි. නමුත් මෙයට අදාළ ලිඛිත ගිවිසුම එවකට සිටි අධ්‍යක්ෂ ජනරාල් අත්සන්තබා නොතිබුණි. ඒ අනුව, අදාළ ගෙවීම් සිදු කිරීමට නොහැකි වී තිබිණි. ගිවිසුම අත්සන් නොකිරීම හා කොරෝනා ව්‍යසනය නිසා මධ්‍යම සංස්කෘතික අරමුදලේ ඇති වූ මූල්‍ය අර්බුදය හේතුවෙන් මෙම කොන්ත්‍රාත්තුවේ වැඩ කිරීම නැවතී ගොස් තිබිණි.<br><br>උක්ත කොන්ත්‍රාත්කරු සමග සාකච්ඡාවක් ඉදිරියේ දී පැවැත්වීමට නියමිත අතර, මෙම දුර්වල පාෂාණයකින් නිමවා තිබූ පිළිම වහන්සේගේ ආරක්ෂාව සඳහා 2025 වැඩ සැලැස්මට මෙම කාර්යය ඇතුළත් කර මෙම පියස්ස ඉදිකිරීමේ ඉතිරි කටයුතු කඩිනමින් සිදු කිරීමට නියමිත බව කාරුණිකව දන්වා සිටිමි. | පනත ප්‍රකාරව පුරාවිද්‍යා ස්මාරක ආරක්ෂාව හා සංරක්ෂණය සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඒ) සිසු දහම් සෙවන තෙවන අදියරේ පැකේජ් A යටතේ දහම් පාසල් ගොඩනැගිලි 16 ක් පැකේජ B යටතේ දහම් පාසල් ගොඩනැගිලි 06 ක් සහ පැකේජ C යටතේ දහම් පාසල් ගොඩනැගිලි 04 ක් වශයෙන් දහම් පාසල් ගොඩනැගිලි 26 ක් ඉදිකිරීම සඳහා 2019 ඔක්තෝබර් 31 දින වැඩ අවසන් කිරීමේ පදනම මත ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව හා අරමුදල අතර දින හා වටිනාකම් රහිතව අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණි. කෙසේ වෙතත් 2024 ජූනි 30 දිනවන විටත් එම ගොඩනැගිලි ඉදිකිරීම්වල භෞතික ප්‍රගතිය | සිසු දහම් සෙවන දීප ව්‍යාප්ත වැඩසටහන යටතේ තුන්වන අදියරට අයත් දහම් පාසැල් ගොඩනැගිලි ඉදිකිරීම සම්බන්ධයෙන් සහ ඉතිරි ගෙවීම් සම්බන්ධව කමිටුවක් පිහිටුවා රාජ්‍ය ආයතන සමග සාකච්ඡා කර ගෙවීම් කිරීමට කටයුතු කිරීම සඳහා පාලක මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර පාලක මණ්ඩලය විසින් ලබාදෙන තීරණය අනුව ඉදිරි කටයුතු කිරීමට පියවර ගන්නා බව දන්වා තිබුණි. | අමාත්‍යමණ්ඩල තීරණය ප්‍රකාරව කාර්යක්ෂමව හා ඵලදායිව ව්‍යාපෘති නිමකළ යුතුය. |

| | | |
|---|---|---|
| සියයට 65 ක් පමණක් වූ අතර, මෙම කාර්යය සඳහා අරමුදල විසින් සංස්ථාව වෙත අත්තිකාරම් ලෙස රු.33,600,000 ක මුදලක් ගෙවා තිබුණ ද අපේක්ෂිත පරමාර්ථ ඉටුකරගෙන නොතිබුණි. | | |
| (ඔ) සිසු දහම් සෙවන තෙවන අදියර පැකේජ A යටතේ දහම් පාසල් ගොඩනැගිලි 28 ක්, පැකේජ B යටතේ දහම් පාසල් ගොඩනැගිලි 32 ක් හා පැකේජ C යටතේ දහම් පාසල් ගොඩනැගිලි 28 ක් වශයෙන් දහම් පාසල් ගොඩනැගිලි 88 ක් ඉදිකිරීම් සඳහා 2019 ඔක්තෝබර් 31 දින වැඩ අවසන් කිරීමේ පදනම මත රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව හා අරමුදල අතර දින හා වටිනාකම් රහිතව අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණි. කෙසේ වෙතත් 2024 ජුනි 30 දිනවන විටත් ඉන් දහම් පාසල් ගොඩනැගිලි 20 ක වැඩ ආරම්භ කර නොතිබුණි. වැඩ ආරම්භ කර තිබූ දහම් පාසල් ගොඩනැගිලි 68 ක භෞතික ප්‍රගතිය සියයට 10 ත් 23 ත් අතර විය. කෙසේ වුවද මෙම දහම් පාසල් ගොඩනැගිලි ඉදිකිරීම වෙනුවෙන් අත්තිකාරම් ලෙස සංස්ථාව වෙත රු.21,800,000 ක් අරමුදල විසින් ගෙවා තිබුණ ද වැඩ අවසන් කර ගැනීමට පාලනාධිකාරිය කටයුතු කර නොතිබුණි. | සිසු දහම් සෙවන දීප ව්‍යාප්ත වැඩසටහන යටතේ තුන්වන අදියරට අයත් යටතේ දහම් පාසැල් ගොඩනැඟිලි ඉදිකිරීම සම්බන්ධයෙන් සහ ඉතිරි ගෙවීම් සම්බන්ධව කමිටුවක් පිහිටුවා රාජ්‍ය ආයතන සමග සාකච්ඡා කර ගෙවීම් කිරීමට කටයුතු කිරීම සඳහා පාලක මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර පාලක මණ්ඩලය විසින් ලබාදෙන තීරණය අනුව ඉදිරි කටයුතු කිරීමට පියවර ගන්නා බව දන්වා තිබුණි. | අමාත්‍යමණ්ඩල තීරණය ප්‍රකාරව කාර්යක්ෂමව හා ඵලදායිව ව්‍යාපෘති නිමකළ යුතුය. |
| (ඕ) අරමුදලේ රු.100,000,000 ක මුදලක් ආයෝජනය කිරීමට අදාළව කොල්ලුපිටිය ලංකා බැංකු ප්‍රධාන කළමනාකරු විසින් එවා තිබූ අංක PBU143 හා 2023 දෙසැම්බර් 13 දිනැති ලිපියෙන් ඉදිරිපත් කර තිබූ පොලී අනුපාත අරමුදලේ නිලධාරියෙක් විසින් වෙනස් කර තිබුණි. ආයොජන තීරණ ගැනීම සඳහා රාජ්‍ය බැංකුවක ලිපි ශීර්ෂ යොදා ගනිමින් සාවද්‍ය ලෙස පොළී අනුපාත වෙනස් කිරීමට කටයුතු කර තිබුණද මේ පිළිබඳ විමර්ශනයක් සිදුකර වගකිව යුතු පාර්ශවයන් හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම විමසුමෙන් පෙන්වා දී තිබෙන කරුණු සඳහා අභ්‍යන්තර විගණක විසින් වාර්තාවක්ද ඉදිරිපත් කර ඇති අතර, ඒ පිළිබඳව මූලික විමර්ශනයක් කිරීම සඳහා අමාත්‍යංශය වෙත යොමුකර ඇත. | විමර්ශන කඩිනමින් අවසන් කර වගකිව යුතු පාර්ශවයන් වෙත විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) අරමුදල මඟින් පාලනය වන ස්ථානවලට ප්‍රවේශ වීම හා නැරඹීම සඳහා අරමුදල මඟින් නිකුත් කරනු ලබන ප්‍රවේශපත්‍ර මුද්‍රණය හා මුද්‍රණය කරන ලද ප්‍රවේශපත්‍ර තොග මධ්‍යම සංස්කෘතික අරමුදලට අයත් අතපත්තු ගොඩනැගිල්ලෙහි පවත්වාගෙන ගොස් තිබුණි.මේ සඳහා ප්‍රවේශපත්‍ර වර්ග 74 ක් මුද්‍රණය කර තිබෙන අතර මෙම මුද්‍රණය කරනු ලබන ප්‍රවේශ පත්‍ර තොග ලැබීම් සඳහා ලේඛනයක් සහ ප්‍රවේශපත්‍ර තොග නිකුත් කිරීම සඳහා නිකුත් කිරීමේ ලේඛනයක් වශයෙන් තොග ලේඛන පොත් දෙකක් පවත්වාගෙන ගොස් තිබූ අතර ප්‍රවේශපත්‍ර වර්ග 74 ට අයත් මුද්‍රණය කරන ලද ප්‍රවේශපත්‍ර ලැබීම සහ නිකුත් කිරීම සඳහා අදාළ විස්තර ඇතුලත් වෙනම නඩත්තු කරනු ලබන තොග පත්‍ර (Bin Card) සහිත පාලන ක්‍රමයක් පවත්වා ගෙන ගොස් නොතිබීම හේතුවෙන් ප්‍රවේශපත්‍ර තොග ශේෂයෙහි නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය. | මෙම විගණන විමසුමෙන් පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් නිවැරදිව කටයුතු කිරීමට විගණන නිළධාරී විසින් අදාළ ස්ථානය පරීක්ෂාකර දිනම අවශ්‍ය කටයුතු සිදුකරන ලදි. ඒ අනුව මුද්‍රිත ප්‍රවේශපත්‍ර තොග ලැබීම් සහ නිකුත් කිරීම් පිළිබඳ තොරතුරු එකම ලේඛනයක සටහන් කර පවත්වාගෙන යාමට මේ වනවිටත් කටයුතු කර ඇති බව දන්වා තිබුණි. | තොගපැවැත්වීම සඳහා විධිමත් තොග ලේඛන පවත්වාගත යුතුය. |
| (ආ) මහජන බැංකුව විසින් ඉදිරි වසර 5 සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රධාන ව්‍යාපෘතීන් වන සීගිරිය, පොළොන්නරුව, අනුරාධපුර ඇතුලු අනෙකුත් සියලු ව්‍යාපෘතීන්වල ඒකාබද්ධව ක්‍රියාත්මක කළහැකි දේශීය විදේශීය සංචාරකයින් වෙත ඉලෙක්ට්‍රොනික් ප්‍රවේශපත්‍ර නිකුත්කිරීමේ නව පද්ධතියක් සඳහා යෝජනාවක් ඉදිරිපත් කර තිබුණි. එම යෝජනාව සඳහා 2022 අප්‍රේල් 28 දිනැති පාලක මණ්ඩල පත්‍රිකා අංක 215.05.09 මඟින් අනුමැතිය ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව 2022 සැප්තැම්බර් 16 දින දෙපාර්ශවය අතර අවබෝධතා ගිවිසුමකට එළඹ තිබූ අතර ගිවිසුමේ 2.6 වගන්තිය අනුව අරමුදල විසින් මහජන බැංකුවේ | මෙම විගණන විමසුම සම්බන්ධයෙන් පෙන්වා තිබෙන කරුණු සියල්ලක්ම නිවැරදි බවට පිළිගනිමි. | පනත ප්‍රකාරව සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් (ඇමෙරිකානු ඩොලර්) සහ දේශීය මුදල් ගිණුමක් (රුපියල්) ආරම්භ කර පවත්වාගෙන යාමට එකඟතාවයකට එළඹ තිබුණි. එහෙත් 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල් පනතේ 06 වැනි වගන්තිය ප්‍රකාරව අරමුදල් ගිණුම ලංකා බැංකුවෙහි පමණක් පවත්වා ගත යුතු බවට සඳහන්ව තිබිය දී පනත සංශෝධනය කර ගැනීමකින් තොරව මහජන බැංකුවේ විදේශ ව්‍යවහාර ගිණුමක් පවත්වා ගෙන යාමට අවබෝධතා ගිවිසුමක් හරහා එකඟ වී තිබුණි. | දෙස් විදෙස් සංචාරකයින් සඳහා ප්‍රවේශපත්‍ර කවුළු හරහා පමණක් මුද්‍රණය කර නිකුත් කරනු ලැබූ ප්‍රවේශපත්‍ර වෙනුවට 2017 වර්ෂයේදී ICTA ආයතනය මගින් සියලුම ව්‍යාපෘති සඳහා Online ක්‍රමවේදය ඔස්සේ ඉලෙක්ට්‍රොනික් ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු මුදල රුපියල් මිලියන 27ක් බව දන්වා තිබුණි. | |
| (ii) එම ගිවිසුමට එළඹීමෙන් මාස 7 කට පසු එනම් 2023 අප්‍රේල් 27 දින ඉහත යෝජනා සම්බන්ධයෙන් අනුමැතිය ලබාගැනීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර තිබූ අතර 2023 මැයි 30 දිනැති අමප/23/0884/620/026 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ඒ සඳහා අනුමැතිය ලබා දී තිබුණි. | සංචාරකයින් සඳහා කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් සැපයීම සඳහා නවීන තාක්ෂණයෙන් යුක්තව සියලුම ව්‍යාපෘති සඳහා දෙස් විදෙස් සංචාරකයින් වෙනුවෙන් සුහුරු ටිකට්පත් (Smart Tickets) නිකුත් කිරීමට හැකි නව පද්ධතියක් අත්‍යවශ්‍ය වී ඇත. | අමාත්‍ය මණ්ඩල සංදේශයට නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |
| (iii) එමෙන්ම අවබෝධතා ගිවිසුමේ 2.9 වගන්තිය ප්‍රකාරව ආරම්භ කරන ලද විදේශ ව්‍යවහාර මුදල් ගිණුමේ ඇමෙරිකානු ඩොලර් 100,000 හෝ පසුගිය වර්ෂයේ මුළු තැන්පතුවලින් සියයට 10 ක් යන අගයන්ගෙන් වැඩි අගය පවත්වාගෙන යාමට එකඟ වී තිබූ අතර එවැනි මුදලක් නිරන්තරයෙන් ගිණුමක පවත්වාගෙන යාම තුළින් මධ්‍යම සංස්කෘත අරමුදල පනතේ පරමාර්ථ ඉටුකිරීම සීමාවීමක් සිදු විය හැකි බැවින් හා ඊට අදාල පොලී මුදල අහිමිවීම තුළ එවැනි එකඟතාවයකට පැමිණීම විගණනයේ දී ගැටලු සහගත බව නිරීක්ෂණය විය. | ඒ සඳහා මහජන බැංකුවේ පූර්ණ දායකත්වය ලබාදීමට එකඟතාවය එලකර ඉදිරිපත් කර ඇති යෝජනාවලියට අනුව ඉදිරි වර්ෂ පහක කාලයක් සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදලේ සියලුම ව්‍යාපෘති ඒකාබද්ධව ක්‍රියාත්මක කළ හැකි ඉලෙක්ට්‍රොනික ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ පද්ධතියක් ස්ථාපනය සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් (23/0884/620/026) යටතේ කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කර සංදේශයේ සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින් 2023.05.22 අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. | ගිවිසුම්වලට එළඹීමේදී අරමුදලට වාසිදායක වන ලෙසට කටයුතු කළ යුතුය. |
| (iv) අවබෝධතා ගිවිසුමේ 2.2 වගන්තිය ප්‍රකාරව අරමුදලේ අනුමැතිය ලැබීමෙන් මාස 03 ක් තුළ ඉලෙක්ට්‍රොනික ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ | මහජන බැංකුව සමග මූලික අවබෝධතා ගිවිසුමක් මගින් එකගත්වයට පැමිණ නව E-Ticketing පද්ධතියක් හඳුන්වා දී ඇත. මේ සම්බන්ධයෙන් තව දුරටත් පාලක මණ්ඩලය සමග සාකච්ඡා කර එහි තීරණයන් | ගිවිසුම්වලට එළඹීමේදී අරමුදලට වාසිදායක වන ලෙසට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| පද්ධතිය ස්ථාපිත කළ යුතු වුවත් 2024 දෙසැම්බර් 31 දින තෙක් මෙම පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි. එසේ වුවද මහජන බැංකුවට අයත් විද්‍යුත් කාඩ්පත් හරහා ගාස්තු අයකිරීමේ යන්ත්‍ර (POS Machine) සියලු ස්ථානවල ස්ථාපිත කර තිබූ අතර ඒ අනුව 2023 වර්ෂය තුළ විද්‍යුත් කාඩ්පත් හරහා ඉපයූ ආදායම් වලින් රු.21,978,335 ක් කොමිස් මුදල් ලෙස මහජන බැංකුව අයකරගෙන තිබුණි. | අනුව ඉදිරියේදී කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | |
| (ඇ) 2022 වර්ෂය සඳහා පුද්ගලික ඉන්ධන පිරවුම්හල් 02 කින් අරමුදල විසින් ඉන්ධන ලබාගෙන තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) අරමුදලේ වාහන සඳහා ඉන්ධන ලබාගැනීමේදි විධිමත් ඉන්ධන ඇණවුම් නිකුත් කිරීමට කටයුතු කර නොතිබූ අතර, ඉන්ධන පිරවුම්හලෙන් ලබා ගත් බිල්පතක් අරමුදලේ ඇණවුම ලෙස භාවිතා කර වාහන සඳහා ඉන්ධන ලබාගෙන තිබුණි. | මෙය නිවැරදි කිරීම සඳහා රජයේ මුද්‍රණාලය විසින් මුද්‍රණය කර ඇති පොදු ආකෘති පත්‍රය භාවිතාකර වාහන සඳහා ඉන්ධන ලබාදීමට කටයුතු කරනු ලැබේ. | රජයේ ඉන්ධ ඇනවුම් භාවිතා කල යුතුය. |
| (ii) වාහන භාර නිලධාරියාගේ නිර්දේශය හා අධ්‍යක්ෂ (පාලන) /පරිපාලන නිලධාරිගේ අනුමැතිය මත ඉන්ධන ලබාගැනීම සිදුකළ යුතු වුවද එම නිලධාරීන්ගේ නිර්දේශය හා අනුමැතියකින් තොරව වාහන 16 ක් වෙනුවෙන් වටිනාකම රු.4,371,918 ක ඉන්ධන ලබාගෙන තිබුණි. | හදිසි අවශ්‍යතාවය මත අදාළ නිලධාරීන් නොමැති අවස්ථාවලදී මෙසේ කටයුතු කිරීමට සිදු වී තිබේ. වර්තමානයේදී නිවැරදිව කටයුතු කරමින් පවතී. | වගකිව යුතු පාර්ශව හඳුනාගැනීමට කටයුතු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (iii) ඉන්ධන පිරවුම්හල මඟින් ඉදිරිපත් කළ මාසික බිල් සාරාංශය තුළ සඳහන් ඇණවුම් අංකවලට අදාළ අනුමත ඉන්ධන ඉල්ලුම් පත් ලිපිගොනු තුළ නොවූයෙන් වාහන සඳහා ඉන්ධන ලබාගැනීම නිසි අනුමැතියක් මත සිදුකළේද යන්න විගණනයට තහවුරු කරගැනීම සඳහා සාක්ෂි නොවීය. | දෛනිකව සිදුකරනු ලබන රාජකාරී තුළදී මෙවැනි අවස්ථාවලට මුහුණ පෑමට සිදුවේ. වර්තමානයේදී මෙවැනි අවස්ථා අවමකරගනිමින් කටයුතු කරමින් පවතී. | රජයේ ඉන්ධන ඇණවුම් ලේඛනය භාවිතා කල යුතුය. |

**3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) බුද්ධ ශාසන, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය ඉදිරිපත් කරන ලද අංක MBCRA/CA/CP/2020-17 හා | 2018/2019 වර්ෂයන්හිදී විශාල වශයෙන් වියදම්දරා සිදුකරන ලද ව්‍යාපෘතීන් සඳහා ගෙවීම් සිදු කිරීම 2020/2021 | අරමුදලේ අත්‍යවශ්‍ය නඩත්තු කටයුතු ඇතුලු පුනරාවර්ථන වියදම් පියවා ගැනීමට කිසිදු මුදලක් |

2020 ජුනි 17 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් කොරෝනා වෛරස උවදුර ගෝලීය වශයෙන් ව්‍යාප්ත වීම නිසා සංචාරක කර්මාන්තය මුළුමනින්ම බිඳ වැටී තිබීම හේතුවෙන් 2020 මාර්තු 17 දින සිට අරමුදලේ ප්‍රවේශපත් අලෙවිය නතර වී ඇති බැවින්,සේවක වැටුප් ගෙවීම සඳහා මසකට වැයවන රු.මිලියන 110 ක පමණ මුදල සහ වෙනත් අත්‍යාවශ්‍ය නඩත්තු වියදම් වන ජලය, විදුලිය, දුරකථන, ඉන්ධන ආදිය සඳහා මසකට රු.මිලියන 25 ක් ඇතුළු රු.මිලියන 135 ක මුදල මධ්‍යම සංස්කෘතික අරමුදල වෙත මාස්පතා සංචාරක කර්මාන්තය යථා තත්ත්වයට පත්වන තෙක් මහා භාණ්ඩාගාරය හරහා ලබා ගැනීමට අනුමැතිය ඉල්ලා තිබුණු අතර ඒ සඳහා 2020 ජුලි 03 දින අමාත්‍යමණ්ඩලය මගින් අනුමැතිය ලැබී තිබුණි. 2019 දෙසැම්බර් 31 දිනට අරමුදල සතුව නිශ්චිත අවශ්‍යතාවයකට අදාල නොවූ අතිරික්ත අරමුදල් ආයෝජනය කර තිබූ ස්ථාවර තැන්පතු රු.මිලියන 5,342 ක් පැවතිය දී, 2020 වර්ෂයේ ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර් මාස තුළ දී රු.මිලියන 405 ක් සහ 2020 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු රු.මිලියන 5,040 ක් පැවතිය දී 2021 වර්ෂය තුළ රු.මිලියන 327.2 ක් ලෙස එකතුව රු.මිලියන 732.5 ක් වරින් වර භාණ්ඩාගාරයෙන් ලබාගෙන තිබුණි.ඒ අනුව අරමුදලේ කටයුතු සඳහා මුදල් තිබියදී භාණ්ඩාගාරයෙන් මුදල් ඉල්ලීමට කටයුතු කිරීම විගණනයේ දී ගැටලු සහගත විය. වර්ෂවලදී රටෙහි පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් දේශීය හා විදේශීය සංචාරකයන්ගේ පැමිණීම සීඝ්‍රලෙස පහත වැටුණු හෙයින් ආදායම නොලැබීයාම හේතුවෙන් අත්‍යාවශ්‍ය පුනරාවර්තන වියදම් හා අනෙකුත් අත්‍යාවශය වියදම් පියවා ගැනීම පිණිස මෙසේ භාණ්ඩාගාරයෙන් මුදල් ලබාගැනීමට සිදු වූ බව දන්වා තිබුණි. අරමුදලට රැස් නොවන බව අමාත්‍ය මණ්ඩල සංදේශයේ දක්වා තිබුණද ස්ථාවර තැන්පතු ලෙස රු. මි. 5000 කට අධික මුදලක් පැවති බැවින් හා එයින් පොලී උපයන බැවින් අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීමේදී නිවැරදි තොරතුරු ඇතුලත් කිරීමට කටයුතු කල යුතුය.

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) "පිබිදෙමු පොළොන්නරුව" ව්‍යාපෘතියට සමගාමීව උරුම නගරයක් ලෙස පොළොන්නරුව පූජා නගරය ආශ්‍රිත කලාපය සංවර්ධනය කිරීමේ යෝජනාවට අනුව මධ්‍යම සංස්කෘතික අරමුදලේ පොළොන්නරුව ව්‍යාපෘති කාර්යාලය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල සහිත භූමිය උරුම කළමනාකරණ මධ්‍යස්ථානයක්, පුරාවිද්‍යා තොරතුරු මධ්‍යස්ථානයක් හා සාම්ප්‍රදායික නිෂ්පාදන අලෙවිසැලක් ලෙස සංවර්ධනය කිරීමට අදාළව උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් 2018 මැයි 28 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අංක අමප/18/1132/824/007 දරන 2018 ජුනි 13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ. | | |
| (i) විධිමත් ඉඩම් පවරා ගැනීමකින් තොරව අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි පිබිදෙමු පොළොන්නරු වැඩසටහනට සමගාමීව අරමුදලේ පොළොන්නරු ව්‍යාපෘති කාර්යාල භූමිය තුල පුරාවිද්‍යා තොරතුරු මධ්‍යස්ථානයක් හා සාම්ප්‍රදායික අලෙවිසැලක් ඉදිකිරීම සඳහා රු.39,374,087 ක් සහ සියයට 10 ක අවිනිශ්චිත වියදම් ඇතුලත් ගාස්තුවකට යටත්ව ඉදිකිරීම් කටයුතු මධ්‍යම ඉංජිනේරු සේවා පුද්ගලික සමාගම වෙත පැවරීමටත් ඇස්තමේන්තුගත මුදලින් 3%ක ගාස්තු ගෙවීමට යටත්ව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යංශය උපදේශක ලෙස පත්කිරීමටද අනුමැතිය ලබා දී තිබුණි. එසේ තිබියදී අරමුදල විසින් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යංශය සමඟ 2019 මාර්තු 20 දින මාස 6කින් වැඩ අවසන් කර භාර දීමට ගිවිසුමක් අත්සන් කර ඒ සඳහා රු.15,864,480ක් ගෙවීම් කර මාස 54ක් ගතව ඇතත් අදාල කාර්යය නිමකර නොතිබුණු අතර 2018 සැප්තැම්බර් 07 දින වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස රු.7,785,380ක මුදලක් ගිවිසුම් අත්සන් කිරීමට මාස 6කට පෙර ගෙවීම් කර තිබුණි. | පිබිදෙමු පොළොන්නරුව උරුම කළමනාකරණ මධ්‍යස්ථානය ඉදිකිරීමේ ටෙන්ඩර් පරිපාටියට බැහැරව මධ්‍යම ඉංජිනේරු උපදේශ කාර්යාංශය (CECB) හා සීමාසහිත මධ්‍යම ඉංජිනේරු සේවා පුද්ගලික සමාගම (CESL) වෙත අමප/08/0173/344/002 හා 2008.02.06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය (ඇමුණුම-24) අමාත්‍ය මණ්ඩල සංදේශ අංක HECA/CA/2018/01 අනුව පිරිනමා ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ii) මෙකී පසුබිම තුල කොන්ත්‍රාත්තුව එම ප්‍රමාණයෙන් අවසන් කර බිල්පත් ගෙවා ඉතිරි වැඩ ප්‍රමාණය ආයතනයේ සේවකයන් යොදවා අවසන් කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කර තිබුණි. කෙසේ නමුත් අත්තිකාරම් මුදල සහ අතුරු බිල්පත් 02 ක් හරහා මේ දක්වා රු.15,864,480 ක් ගෙවා තිබූ අතර 2024 මැයි 02 දින සකස් කරන ලද ගෙවීමට නියමිතව තිබූ අතුරු | අත්තිකාරම් මුදල වන රු.7,785,380.50ක් ගෙවා ඇත. බිල්පත් 03කින් අත්තිකාරම් මුදලින් රු. 6,825,065.96 ක් අඩු කර ගෙන ඇත. | සහතික කල වැඩ වටිනාකම ඉක්මවා කරන ලද ගෙවීම් අය කර ගත යුතුය. |

| | | |
|---|---|---|
| බිල්පත් අංක 04 ට අනුව සහතික කළ මුළු වැඩ වටිනාකම රු.13,954,221 ක් වී තිබුණි. ඒ අනුව සහතික කළ වැඩ වටිනාකම ඉක්මවා රු.1,910,259 ක් වැඩිපුර මුදල් ගෙවා තිබුණි. | ඉතිරි වී ඇති අත්තිකාරම් මුදල් අඩු කර බිල්පත සඳහා ගෙවීම් කර ගන්නා බව මෙයින් දන්වා තිබුණි.<br><br>ඉතිරි ඉදිකිරීම් කාර්යයන් 2025 වැඩ සැලැස්මට ඇතුලත් කර අවසන් කිරීමට නියමිත බව දන්වා තිබුණි. | |
| (ආ) පොකුණුවිට කිත්සිරිමෙවන් රජමහා විහාරයේ ආවාසගෙය සංරක්ෂණය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව රු.15,751,380 ක මුදලකට පුද්ගලික ඉදිකිරීම් ආයතනයකට 2019 ජනවාරි 17 දින ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබූ අතර, අදාළ ආයතනය විසින් නියමිත කාලය තුළ කොන්ත්‍රාත්තුව නිමකර තිබෙන බව ලිපිගොනු අනුව නිරීක්ෂණය විය. ඒ අනුව ගිවිසුම්ගත ආයතනය විසින් කොන්ත්‍රාත්තුවට අදාළ නිමකරන ලද කාර්යයන් වෙනුවෙන් රු.13,167,405 ක උපදේශක සමාගම විසින් සහතික කරන ලද බිල්පත් 03ක් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත් එම කාලය තුළ රු.1,000,000 ක මුදලක් පමණක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. | මෙම විගණන විමසුමෙන් පෙන්වා දී තිබෙන නිරීක්ෂණ නිවැරදිය. මෙම කොන්ත්‍රාත්තුව අවසන් කර ඇති බැවින් අදාළ බිල්පත් ගෙවීමට පරීක්ෂා කර බලා ඉදිරියේදී කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | කොන්ත්‍රාත්තුවට අදාල ගිවිසුම් ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 3.6 වාෂරීක කායර්සාධන වාතර්ාව සහාගත කිරීම

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 1/2020 හා 2020 අගෝස්තු 27 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 877 (ඉ) ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 05 ක් තුළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් 2015 වර්ෂයෙන් පසුව අරමුදලේ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2016 වාර්ෂික වාර්තාව මුද්‍රණයකර අවසන් කර ඇති අතර, කඩිනමින් සභාගත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික වාර්තා සභාගත කල යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අරමුදල වෙනුවෙන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 17 ක්, තෘතියික මට්ටමේ තනතුරු 46 ක්, ද්විතියික මට්ටමේ තනතුරු 478 ක් ප්‍රාථමික මට්ටමේ තනතුරු 2,468 ක් වශයෙන් 3009 ක කාර්යය මණ්ලයක් අනුමත කර තිබුණි. කෙසේ වෙතත් 2023 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 17 න් 15 ක් පුරප්පාඩු පවතින අතර ජ්‍යෙෂ්ඨ විධායක මට්ටමේ තනතුරු 7 සඳහාම කොන්ත්‍රාත්, ද්විතීක සහ වැඩ බැලීමේ පදනම මත නිලධාරීන් සේවයේ යොදවා තිබුණි. මේ තත්ත්වය අරමුදලේ අරමුණු කරා ළඟාවීමට හා දිගුකාලීන සැලැස්මක් ඇතිව අරමුදල මෙහෙයවීමට බාධාවක් වී නොතිබුණේය යන මතය විගණනයේදී බැහැර කළ නොහැකි විය. | • මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද BD/CBP/01/01/02-2021 හා 2021.12.31 දිනැති අයවැය චක්‍රලේඛ අංක 03/2021 මගින් රාජ්‍ය වියදම් කළමනාකරණය යටතේ රාජ්‍ය සේවයේ බඳවාගැනීම් අත්හිටුවා තිබුණි.<br>• රාජ්‍ය සේවයේ බඳවාගැනීම් සම්බන්ධව අග්‍රාමාත්‍ය ලේකම්ගේ සභාපතිත්වයෙන් යුත් කමිටුව විසින් 2023.10.27 දින තනතුරු 07 ක් සඳහා පමණක් බඳවාගැනීම් සිදුකිරීමට අනුමැතිය ලබා දී ඇති අතර, වරින් වර විවිධ තනතුරු සඳහා බඳවා ගැනීමට අනුමැතිය ලබා ගන්නා ලද අතර, 2024 ජනාධිපතිවරණ හා මහමැතිවරණය හේතුවෙන් මෙම බඳවා ගැනීම් කටයුතු මැතිවරණ කාලසීමාවෙන් පසුව සිදුකරන ලෙස දැනුම් දී ඇත. | වසර 10 කට අධික කාලයක් තිස්සේ බඳවා ගැනීමේ පටිපාටියට අනුව බඳවා ගැනීම් සිදු කල යුතුය. |